**සීමාසහිත ලංකා නැව් සංස්ථාව- 2015**

**------------------------------------**

සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ 2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය කරගෙන යාම සඳහා ප්‍රසිද්ධ වෘත්තීයේ යෙදී සිටින වරලත් ගණකාධිකාරි සමාගමක් මට සහාය විය. විස්තරාත්මක වාර්තාවක් සමාගමේ සභාපති වෙත 2016 ජුනි 30 වන දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 සමාගම පිහිටුවීම හා අයිතිය

**----------------------------**

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව වගකීම් සීමාසහිත සමාගමක් ලෙස සී/ස ලංකා නැව් සංස්ථාව සංස්ථාපනය කර ඇත. එමෙන්ම රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත් කිරීමේ 1987 අංක 23 දරන සමාගම් පනතින් හා 2007 අංක 07 දරන සමාගම් පනතින් මෙම සමාගම ලියාපදිංචි කර ඇත. තවද මෙය මුළුමනින්ම රජයට අයත් සමාගමක් වන අතර එහි කොටස් හිමිකාරත්වය සම්පූර්ණයෙන්ම මහා භාණ්ඩාගාරය සතුව පවතී.

2. මූල්‍ය ප්‍රකාශන
--------------

2.1. මතය
------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 මාර්තු 31 දිනට සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

2.2.1 පරිපාලිත සමාගම ඈවර කිරීම
----------------------------------

ආයතනයේ පරිපාලිත සමාගමක් වූ සිලෝන් ෂිපින් ඒජන්සි (පුද්) සමාගම 2006 මාර්තු 20 දිනැති ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මෙහෙයුම් කටයුතු අත්හිටුවා ඈවරකරුවෙකු පත්කර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම ඈවර කටයුතු අවසන් කර නොතිබුණි.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති
--------------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39
-------------------------------------

වර්ෂ 04 සිට වර්ෂ 37 දක්වා වූ දීර්ඝ කාල පරාසයක් තුළ සමාගමට අයවිය යුතුව පවතින බැංකු ඇප තැන්පතු, ආරක්ෂිත තැන්පතු හා අත්තිකාරම් ගිණුම් තුනක එකතුව රු.2,486,989ක්වූ ලැබියයුතු ශේෂ සම්බන්ධයෙන් අපහායන වෙන්කිරීම් (Impairment Provision) සිදුකර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

බැංකු ගිණුම් අතර අරමුදල් හුවමාරුව සඳහා යොදා ගන්නා අරමුදල් හුවමාරු ගිණුමෙහි (Transfer of Fund Account) 2015 මාර්තු 31 දිනට ශූන්‍ය ශේෂයක් පැවතිය යුතු වුවත් එදිනට රු.2,908,878ක ගෙවිය යුතු ශේෂයක් පැවතුණි.

2.2.4 පැහැදිලි නොකල වෙනස්කම්
----------------------------------

ගිණුම් විෂයයන් 7 කට අදාළව 2015 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන් හා ඊට අදාල උපලේඛන අතර රු. 4,657,971,103ක වෙනස්කම් පැවතුණි.

2.2.5 අසම්භාව්‍ය බැරකම්
------------------------

සමාගම විසින් නෞකා 02 ක් මිලදී ගැනීම වෙනුවෙන් රාජ්‍ය වාණිජ බැංකුවක් හරහා එ.ජ.ඩො.මිලියන 80 ක ණය මුදලක් ලබාගැනීමට ගිවිසගෙන තිබුණි. ඒ සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව 2014 අගෝස්තු 26 දින වසර 02 මාස 06 ක සහන කාලයක් සහිතව වසර 15 ක භාණ්ඩාගාර ඇප සහතිකයක් ලබාදී තිබුණි. සමාගමේ මෙම බැරකම සම්බන්ධයෙන් භාණ්ඩාගාරය වෙත අසම්භාව්‍ය බැරකමක් පැනනැගී තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වසර 03 සිට වසර 17 ක් දක්වා කාලයක සිට පවතින එකතුව රු.162,050,121ක් වූ ණයගැති ශේෂ 10ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් නිරවුල් වී නොතිබුණි. තවද මෙම ශේෂ සම්බන්ධයෙන් සනාථ කිරීම්ද ලැබී නොතිබුණි.

(ආ) සමාගමේ බැංකු ගිණුමකට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි 2009 ජුලි මාසයේ සිට පවතින රු.519,516 ක් වූ හඳුනානොගත් තැන්පතුවක් දක්වා තිබුණි.

(ඇ) සමාගම විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත වැඩිපුර ප්‍රේෂණය කර ඇතිබව සඳහන් එකතුව රු.21,549,126ක භාණ්ඩ හා සේවා බදු හා ජාතික ආරක්ෂක බදු ව්‍යවස්ථාපිත අයවීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.වසර 15කට ආසන්න කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවත්නා එම මුදල අයකර ගැනීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පැවතුණි.

(ඈ) 2012 වර්ෂයේ සිට පවතින ගෙවිය යුතු ගිණුම් 07ක එකතුව රු.69,544ක හර ශේෂ හා එකතුව රු 4,355,641ක බැර ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.

(ඉ) විදේශ වෙළඳ ණයහිමියන් හා විදේශ ඒජන්තවරුන් වෙත ගෙවිය යුතු එකතුව රු.601,949,080 ක ශේෂ 6ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම ශේෂ සඳහා ශේෂ සනාථ කිරීම්ද ලැබී නොතිබුණි.

## 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම වෙනුවෙන් ඉදිකරනු ලබන නව නෞකා දෙකෙහි මූලික වැඩ ඇරඹීම සඳහා 2014 සැප්තැම්බර් 01 සිට 13 දින දක්වා විදේශ රටක පැවති උත්සවයකට (Steel Cutting Ceremony) සහභාගීවී තිබූ සමාගමේ නොවන නිළධාරීන් තිදෙනෙකුගේ විදේශ ගමන් වියදම් හා යාන පත්‍ර මිලදී ගැනීම වෙනුවෙන් රු.1,256,119ක් සමාගම විසින් ගෙවීම් කර තිබුණි.

(ආ) 2011 සැප්තැම්බර් 15 දිනැති අංක පීඩීඑෆ් 58 (2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාර සමාගමේ සභාපතිවරයාට හා විධායක අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතු මාසික දීමනාව පිළිවෙළින් රු. 60,000 ක් හා රු.45,000 ක් වුවත් ඊට පටහැනි ලෙස පිළිවෙළින් රු.85,000 ක් හා රු.75,000ක් ගෙවා තිබුණි.

(ඇ) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් සභාපතිවරයා වෙත හා විධායක අධ්‍යක්ෂවරයා වෙත පිළිවෙලින් රු.100,000ක හා රු.50,000ක මාසික උපරිමයකට යටත්ව ණය පත්‍ර දීමනාවක් (Credit Card Allowance) අනුමත කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී ණය පත්‍ර වෙනුවෙන් සමාගම විසින් රු.774,048 ක් වැයකර තිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

-----------------------

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ අතිරික්තය රු.124,942,025ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.250,477,673ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.125,535,648 කින් හෙවත් සියයට 50 කින් පිරිහීමක් පෙන්නුම් කෙරුණි. දළ ලාභය රු.198,576,852 කින් වැඩි වුවද වෙනත් ආදායම් රු.120,234,383 කින් අඩුවීම සහ පරිපාලන වියදම් හා බදු වියදම පිළිවෙලින් රු.137,155,480 කින් හා රු.56,321,280 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2010/11 ගිණුම් වර්ෂයේ සිට 2013/14 ගිණුම් වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලය අඛණ්ඩව වර්ධනය වී තිබුණද 2013/14 ගිණුම් වර්ෂයට සාපේක්ෂව 2014/15 ගිණුම් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සියයට 50 කින් පිරිහී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී 2010/11 ගිණුම් වර්ෂයේ රු.117,415,000 ක් වූ දායකත්වය 2014/15 ගිණුම් වර්ෂයේදී රු.485,953,000 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

**3.2** **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

--------------------------------------

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙහෙයුම් ආදායමේ වැඩි වීමක් පෙන්නුම් කළ ද සමාලෝචිත වර්ෂයේ නැව් යාත්‍රා ආදායම (Voyage Income ) සියයට 23කින් අඩුවීමක් සහ කුලී පදනම මත ලබාගත් යාත්‍රා ආදායම (Charter Hire Income) සියයට 100 කින් අඩු වීමක් සිදු වී තිබුණි.

(ආ) නොරොච්චෝලේ තාප බලාගාරය සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගල් අඟුරු මෙට්‍රික් ටොන් 1,859,738ක් ආනයනය කිරීම හේතුවෙන් සමාලොචිත වර්ෂයේ ගල් අඟුරු නෞකා ප්‍රවාහන ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 54කින් වර්ධනය වී තිබුණි.

(ඇ) සමාගමේ පරිපාලන වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 71 කින් වැඩි වී තිබුණි. දිගුකාලීනව අයනොවී පවතින ණයගැති ශේෂ සඳහා අපහායන වෙන්කිරීම් සිදු කිරීම, මෙම වියදම වැඩිවීම කෙරේ මූලිකව බලපා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ ප්‍රමාණාත්මක අනුපාත හා ප්‍රතිශතයන් පහත දැක්වේ.

| | **2014/15 ගිණුම් වර්ෂය** | **2013/14 ගිණුම් වර්ෂය** |
|---|---|---|
| | --------- | --------- |
| දළ ලාභ අනුපාතය සියයට | 78 | 55 |
| ශුද්ධ ලාභ අනුපාතය සියයට | 39 | 59 |
| යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභය සියයට | 3 | 21 |
| ණය එකතු කිරීමේ කාලය -දින | 684 | 884 |
| ණය බේරුම් කිරීමේ කාලය -දින | 1922 | 1222 |
| දිගුකාලීන ණය ප්‍රාග්ධනීකරණ අනුපාතය | 0.69 | 0.0019 |
| ස්කන්ධ ප්‍රාග්ධනයට ණය අනුපාතය | 3.66 | 0.0034 |

i ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 41 කින් වර්ධනය වී තිබුණු අතර යාත්‍රා මෙහෙයුම් සඳහා වන ඍජු වියදම් අඩුවීමත්, ගල් අඟුරු ප්‍රවාහන ආදායම හා ගොඩබෑමේ ආදායම් ඉහළ යාමත් මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ii ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය සියයට 34 කින් අඩු වී තිබුණු අතර වෙළඳ ණය ගැතියන් සම්බන්ධයෙන් රු.මිලියන 138.8කට අධික අපහායන වෙන්කිරීම් (Impairment provision ) සිදුකිරීම හේතුවෙන් පරිපාලන වියදමේ සිදුවූ වැඩිවීම මේ සඳහා හේතු වී තිබුණි.

iii. සමාගම විසින් නෞකා දෙකක් මිලට ගැනීම සඳහා රු. මිලියන 4,862 ක ණය ලබා ගැනීම හේතුවෙන් ස්කන්ධ ප්‍රාග්ධනය මත වන ණය අනුපාතය හා මුළු වත්කම් මත වන ණය අනුපාතයන්ගේ වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**4.1 කාර්ය සාධනය**

------------------

ලංකා නැව් සංස්ථාවේ සාංගමික සංස්ථාපත්‍රය අනුව සමාගමේ මූලික අරමුණු පහත දැක්වේ.

- නෞකා හිමියකු, මගී හා බඩු නෞකා මෙහෙයුම්කරුවකු, තැරැව්කරුවකු, ඒජන්තවරයකු, කළමනාකරුවකු, උපදේශකයකු, රක්ෂණ හා පොදු තැරැව්කරුවකු, ප්‍රවාහකයකු හා නැව් බඩු නිෂ්කාශන හා ප්‍රේෂණකරුවකු ලෙස දේශීයව හා අන්තර්ජාතිකව ව්‍යාපාර කටයුතු කිරීම.

- නෞකා හා මාර්ග ප්‍රවාහන සේවා ඇති කිරීම, නඩත්තුව හා පවත්වාගෙන යාම.

- නෞකා හෝ වෙනත් යාත්‍රා හෝ බහුවිධ හෝ වෙනත් ප්‍රවාහන මාධ්‍ය මිලදී ගැනීම, විකිණීම, කුලියට ගැනීම, ගොඩ නැගීම හෝ වෙනත් ක්‍රමයකට අත්පත් කර ගැනීම සහ ගැඹුරු මුහුදේ හෝ ගංගාවල, ඇලමාර්ග හෝ කලපු ආශ්‍රිතව වියළි තොග, දැව හා වායුමය ද්‍රව්‍ය ප්‍රවාහනය.

- සංචාරක නියෝජිතයකු සහ කොන්ත්‍රාත්කරුවකු ලෙස ව්‍යාපාර කිරීම, සංචාරකයින්ට හෝ මගීන්ට ප්‍රවාහන පහසුකම් සැලසීම හා ඒ පිළිබඳ ප්‍රවර්ධනය කිරීම.

- නෞකා හා වෙනත් බහුවිධ ප්‍රවාහන කටයුතු සම්බන්ධ ව්‍යාපාරවල නියැලෙන ඕනෑම පුද්ගලයෙක්, ආයතනයක් හෝ සමාගමක් සමග ඒජන්තවරයකු ලෙස, කළමනාකරණ ඒජන්තයකු ලෙස, තැරැව්කරුවකු ලෙස ක්රියාකිරීම.

- ලෝකයේ ඕනෑම වරායක් හෝ ගමනාන්තයක් දක්වා ගමන් කිරීමට නෞකා පන්තියක් පිහිටුවීම හා මෙහෙය වීම හෝ යාත්‍රා කිරීම හෝ වෙනත් බහුවිධ ප්‍රවාහන මාධ්‍යයන් ඇති කිරීමට බලපත්‍ර හෝ එකඟතාවයන් ලබා ගැනීම.

- මගීන්ට හා සංචාරකයින්ට ජලාශ්‍රිත විනෝදාස්වාද පහසුකම් සැලසීම හා ඒ ආශ්‍රිත සේවා සැපයීම පිළිබඳ ව්‍යාපාර.

(අ) සමාගමේ මූලික අරමුණුවලින් ඇතැම් අරමුණු ඉටුකර ගැනීම කෙරේ අවධානය යොමු කර නොතිබුණු අතර 2014 හා 2015 වර්ෂවල ක්‍රියාකාරී සැලසුම් අනුව අඩු අවධානයක් යොමුකර තිබුණු අරමුණු සංෂිප්තව පහත දැක්වේ.

(i) නෞකා, ගුවන් හා මාර්ග අනුබද්ධ ප්‍රවාහන සේවා ඇති කිරීම, නඩත්තුව හා පවත්වාගෙන යාම.

(ii) බහුවිධ ප්‍රවාහන ක්‍රම මිලට ගැනීම, විකිණීම, කුලියට ගැනීම, බදු ගැනීම,ඉදිකිරීම හෝ වෙනත් ක්‍රමයකට අත්පත් කර ගැනීම හා ඕනෑම වර්ගයක භාණ්ඩ ප්‍රවාහනයේ යෙදවීම.

(iii) සංචාරක නියෝජිතයකු සහ කොන්ත්‍රාත්කරුවකු ලෙස ව්‍යාපාර කිරීම, සංචාරකයින්ට හෝ මගීන්ට ප්‍රවාහන පහසුකම් සැලසීම හා ඒ පිළිබඳ ප්‍රවර්ධනය කිරීම ආශ්‍රිත ව්‍යාපාර කටයුතු.

(iv) මගීන්ට හා සංචාරකයින්ට ජලාශ්‍රිත විනෝදාස්වාද පහසුකම් සැලසීම හා ඒ ආශ්‍රිත සේවා සැපයීම පිළිබඳ ව්‍යාපාර කටයුතු.

(ආ) සමාගමේ අරමුණු අනුව සමාගමේ කාර්යභාරය සමුද්‍රීය ගමනාගමනය හා නැව් බඩු මෙහෙයුම් හා අනෙකුත් පරිවහන කටයුතු සම්බන්ධ පුළුල් පරාසයක පැතිරී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ දී සමාගමේ මුළු ඉපයුමෙන් සියයට 62කට ආසන්න ප්‍රමාණයක් රාජ්‍ය සමාගමක් වෙත ගල් අඟුරු ප්‍රවාහන සේවා සැපයීමෙන් උපයාගෙන තිබුණි.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නාවික ක්ෂේත්‍රයේ රැකියා උත්පාදනය කිරීමේ අරමුණ ඇතිව ආධුනික නාවිකයන් 100 ක් සඳහා ප්‍රායෝගික පුහුණුව ලබාදීමට සැලසුම් කර තිබුණද ඉන් 35 දෙනෙකුට පුහුණුව ලබා දීම තුළින් අදාල ඉලක්කය කරා ළඟා වීමට නොහැකිවී තිබුණි.

(ආ) I. පිරිවැය මත පදනම් වූ නැව් ගාස්තු මත ,රටට අවශ්‍ය ගල් අඟුරු හා බොර තෙල් ප්‍රවාහනය කිරීම සංස්ථාවට පමණක් හිමිකර දීමට 2014 ජුනි 19 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. ඒ අනුව සමාගම විසින් 2014 නොවැම්බර් 07 සිට 2015 ජනවාරි 04 දක්වා කාලය තුළ බොර තෙල් මෙට්‍රික් ටොන් 258,539 ක් පමණක් රාජ්‍ය සංස්ථාවකට ප්‍රවාහනය කර දී තිබුණි.

II. 2015 වර්ෂය තුළ රාජ්‍ය සංස්ථාවක් වෙනුවෙන් බොරතෙල් මෙට්‍රික් ටොන් 1,710,000 ක් ප්‍රවාහනය කරදීමට සැලසුම් කර තිබියදී 2015 ජනවාරි මාසයෙන් පසු බොර තෙල් ප්‍රවාහන කටයුතු සම්පූර්ණයෙන්ම අත්හිටුවා තිබීම නිසා එම රාජ්‍ය සංස්ථාව විදේශීය සමාගම් මගින් ප්‍රවාහන කටයුතු සිදුකර සමාලෝචිත වර්ෂයේදී බොර තෙල් මෙට්‍රික් ටොන් 1,772,676 ක් පමණ ආනයනය කර තිබීමෙන් පූර්වෝක්ත අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. එමෙන්ම සමාගමට මෙන්ම රජයට උපයා ගැනීමට හැකිව තිබුණු විශාල ආදායමක්ද අහිමිවී තිබුණි.

(ඇ) 2005 මැයි 06 දිනැති, අංක 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සියළු රාජ්‍ය ආයතනවල ආනයන කටයුතු සමාගම හරහා සිදුකලයුතු බවට දක්වා තිබුණද ඊට අනුගතව වෙළඳපල අවස්ථා පුළුල්කර ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

විධිමත් අනුමැතියකින් තොරව රේඛීය අමාත්‍යාංශයට අදාළ පුවත්පත් දැන්වීමක් පළකිරීම වෙනුවෙන් 2014 දෙසැම්බර් 14 දින සමාගම විසින් රු. 2,413,320 ක් එම අමාත්‍යාංශය වෙත ගෙවා තිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

සමාගමේ අනුමත කාර්යය මණ්ඩලය 132 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 115 ක් වීමෙන් අතිරික්ත හා පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව පිළිවෙලින් 06 ක් හා 17 ක් වූ අතර 2016 සැප්තැම්බර් වනවිටත් පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී දින 60ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත්කර තිබුණේ 2016 ජනවාරි 12 දිනදීය. කෙසේ නමුත් කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් 2016 සැප්තැම්බර් 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

---

සමාගමේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර ඇතත් ඒ සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක හැරුණු කොට තවත් එක් නිලධාරියෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. ඒ හේතුවෙන් වාර්ෂික විගණන වැඩසටහන ප්‍රමාණවත් පරිදි ක්‍රියාවට නැංවීමට නොහැකිවී තිබුණි.

**6. පද්ධති හා පාලන**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු විය.

| | <u>පද්ධති හා පාලන ක්ෂේත්‍ර</u> | <u>නිරීක්ෂණ</u> |
|---|---|---|
| (අ) | මූල්‍ය පාලනය | බැංකු සැසඳුම් ප්‍රකාශයන් තුල වසර කීපයක් තිස්සේ පවත්නා හඳුනා නොගත් තැන්පතු, වලංගු කාලය ඉකුත්වූ ඉදිරිපත් නොවූ චෙක්පත් පැවතීම. |
| (ආ) | තොරතුරු තාක්ෂණ හා පොදු පාලනයන් | සමාගම විසින් භාවිතා කරන ගිණුම්කරණ මෘදුකාංගය (IFS) මිලදී ගත් දින සිට මේ දක්වා එහි සැපයුම්කරු විසින් නඩත්තු නොකිරීම, යාවත්කාලීන නොකිරීම, නඩත්තු ගිවිසුමක් නොපැවතීම හා මෙම ගිණුම්කරණ මෘදුකාංගය සමාගමේ වර්තමාන අවශ්‍යතාවයන් සමග අනුකූල නොවීම. |
| (ඇ) | ණය ගැති /ණයහිමි පාලනය | ණයගැති හා ණයහිමි පාලනයේ දුර්වලතා පැවතීම. |